# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2261/56 - 2022 ජනවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2013 (ii)

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 321 වන වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**රෝහිත අබේගුණවර්ධන,**
වරාය හා නාවික අමාත්‍ය.

2021 දෙසැම්බර් මස 29 දින,
කොළඹ දී ය.

නියෝග

1. (1) මේ නියෝග 2021 අංක 08 දරන වෙළඳ නැව් (අන්තරායක භාණ්ඩ ප්‍රවාහනය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ VII වන පරිච්ඡේදය කලින් කලට සංශෝධිත පරිදි වන 1988 ප්‍රොටොකෝලය සහ එම ප්‍රොටොකෝලයට පසුව සිදු කරනු ලබන සංශෝධන බලාත්මක කිරීම මේ නියෝගවල කාර්යය විය යුතු ය.

**1 වන කොටස**

**මේ නියෝගවල අදාළත්වය**

2. (1) මේ නියෝගයේ (2) වන අනු නියෝගවලට යටත්ව, මේ නියෝග:

(අ) ඇසුරුම් කරන ලද ආකාරයෙන් පවතින අන්තරාදායක භාණ්ඩ;
(ආ) ඝන ස්වභාවයෙන් යුත් තොග වශයෙන් පවතින අන්තරාදායක භාණ්ඩ;
(ඇ) තොග වශයෙන් පවතින අන්තරාදායක ද්‍රව රසායනික ද්‍රව්‍ය ; සහ
(ඈ) තොග වශයෙන් පවතින ද්‍රවීකරණය කළ වායු ;

ප්‍රවාහනය කරන නැව්වලට අදාළ විය යුතු ය.

(2) මේ නියෝග,කවර හෝ ස්ථානයක තිබෙන ශ්‍රී ලංකා ධජය ප්‍රදර්ශනය කිරීමට අයිතිය ඇති නැව්වලට සහ ශ්‍රී ලංකා ජල තීරයේ ඇති වෙනත් යම් විදේශීය නැව්වලට අදාළ විය යුතු ය.

(3) (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, යම් නැව් කාණ්ඩයන්ට හෝ තනි නැවක් සඳහා වන නිදහස් කිරීමේ සහතිකයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි නියමයන් මත මේ නියෝගවල විධිවිධාන සියල්ලෙන්ම හෝ යම් විධිවිධානයකින් නිදහස් කිරීම් ප්‍රදානය කරනු ලැබිය හැකි අතර, සාධාරණ දැනුම්දීමක් සිදු කිරීමට යටත්ව එම නිදහස් කිරීම වෙනස් කිරීම හෝ අවලංගු කිරීම සිදු කළ හැකි ය.

(2) (අ) යම් නිදහස් කිරීමක් 2022.01.06 දින අංක 2261/49 දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන 2021 අංක 01 දරන වෙළඳ නැව් (සමීක්ෂණ හා සහතික) නියෝගවල විධිවිධාන අදාළ වන නැවක් වෙත නිකුත් කරනු ලබන අවස්ථාවක, එම නිදහස් කිරීම, එම නියෝගයට අනුකූලව නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) 2022.01.06 දින අංක 2261/49 දරන *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන 2021 අංක 01 දරන වෙළඳ නැව් (සමීක්ෂණ හා සහතික) නියෝග අදාළ නොවන නැවක් වෙත මේ නියෝගය යටතේ ප්‍රදානය කරනු ලැබූ යම් නිදහස් කිරීමක්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියෙන් විය යුතු ය.

## II වන කොටස

## අන්තරාදායක භාණ්ඩ ප්‍රවාහනය

4. (1) අන්තරාදායක භාණ්ඩ පරිහරණය කරනු ලබන, ගබඩා කරනු ලබන හෝ නැවේ ප්‍රවාහනය කරනු ලබන විට, එම භාණ්ඩ අවස්ථාවෝචිත පරිදි පරිහරණය කරනු ලබන, ගබඩා කරනු ලබන හෝ ප්‍රවාහනය කරනු ලබන ආකාරය මගින් යම් තැනැත්තකුගේ සෞඛ්‍යයට සහ ආරක්ෂාවට සැලකිය යුතු අවදානමක් ඇතිවිය හැකි කිසිවක් සිදු නොවන බව සාධාරණ වශයෙන් ප්‍රායෝගිකව හැකිතාක් දුරට වගබලා ගැනීම සෑම ක්‍රියාකරුවකුගේම, නැවක සිටින තැනැත්තන්ගේ සෑම සේවායෝජකයකුගේම සහ සෑම නෞකාධිපතිවරයකුගේම කාර්යය විය යුතු ය. අන්තරාදායක භාණ්ඩ පරිහරණය කිරීම, සංවිධානය විසින් සකස් කරනු ලැබූ මාර්ගෝපදේශවල උචිත විධිවිධානවලට අනුකූලව සිදුකරනු ලැබිය යුතු ය.

(3) (1) වන අනු නියෝගය යටතේ ක්‍රියාකරුගේ, සේවායෝජකයාගේ හෝ නෞකාධිපතිවරයාගේ කාර්යය සඳහා අගතියකින් තොරව, ක්‍රියාකරුගේ සහ සේවායෝජකයාගේ කාර්යය සඳහා විශේෂයෙන් -

(අ) අන්තරාදායක භාණ්ඩ පරිහරණය කිරීම, ගබඩා කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා නැවේ ව්‍යුහය, සවිකුරු හා උපකරණ සැපයීම සහ නඩත්තු කිරීම;

(ආ) නැවේ අන්තරාදායක භාණ්ඩ පරිහරණය කිරීම, ගබඩා කිරීම සහ පරිහරණය කිරීම සම්බන්ධයෙන් සියලුම සේවා නියුක්තයන් වෙත තොරතුරු, උපදෙස්, පුහුණුව සහ අධීක්ෂණය ලබාදීම,

වැනි කාරණා ඇතුළත් විය යුතු ය.

5. ඇසුරුම් කරන ලද ආකාරයෙන් වන අන්තරාදායක භාණ්ඩ ප්‍රවාහනය කිරීම IMDG සංග්‍රහයේ අදාළ විධිවිධානවලට අනුකූලව විය යුතු ය.

6. (1) උචිත පරිදි, අන්තරාදායක භාණ්ඩ ප්‍රකාශයක් හෝ සමුද්‍රීය දූෂණකාරක ප්‍රකාශයක් හෝ ඒකාබද්ධ අන්තරාදායක භාණ්ඩ ප්‍රකාශයක්, නෞකාධිපතිවරයා හෝ ක්‍රියාකරු වෙත ලබා දී ඇත්නම් මිස, කිසිඳු ඇසුරුම් කරන ලද භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා ඉදිරිපත් කිරීම හෝ නැව තුළ ගෙනයාම සිදු නොකළ යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන උප නියෝගයේ සඳහන් ප්‍රකාශය මගින් එම ලේඛනය සකස් කරන ලද දිනය සහ අත්සන්කරුගේ නම, තත්ත්වය සහ සමාගම හෝ සංවිධානය නිවැරදිව හඳුනා ගනු ලැබිය යුතු ය.

(3) 7 වන නියෝගයේ (2) වන උප නියෝගයට අගතියකින් තොරව, පහත දැක්වෙන විස්තර ඇතුළත් ලේඛනයක් නෞකාධිපතිවරයා හෝ ක්‍රියාකරු වෙත ලබා දී ඇත්නම් මිස, කිසිඳු ඇසුරුම් කරන ලද භාණ්ඩයක් ප්‍රවාහනය කිරීම සඳහා ඉදිරිපත් කිරීම හෝ නැව තුළ ගෙන යාම සිදු නොකළ යුතු ය.

(4) එම ලේඛනයේ පහත දැක්වෙන විස්තර ඇතුළත් වේ -

(අ) අදාළ නැව් නාමය;

(ආ) අදාළ වන අවස්ථාවක පන්තිය සහ අංශය;

(ඇ) IMDG සංග්‍රහය විසින් ලබා දී ඇති අවස්ථාවක දී එක්සත් ජාතීන්ගේ (UN) අංක;

(ඈ) අදාළ වන අවස්ථාවක ඇසුරුම්කරණ හෝ ඇසුරුම් කාණ්ඩය;

(ඉ) ඇසුරුම්කරණ සංඛ්‍යාව සහ වර්ගය;

(ඊ) අන්තරාදායක භාණ්ඩවල සමස්ථ ප්‍රමාණය හෝ අඩංගු දේවල ශුද්ධ පිපිරුම් ස්කන්ධය;

(උ) සුදුසු අවස්ථාවක 'සමුද්‍රීය දූෂණකාරකය' යන වචන; සහ

(ඌ) IMDG සංග්‍රහය මගින් නියම කරනු ලැබූ වෙනත් යම් තොරතුරු.

(5) මේ නියෝගයේ (1) වන උප වගන්තියේ සඳහන් ප්‍රකාශය, මේ නියෝගයේ (3) වන උප නියෝගයේ සඳහන් ලේඛනය සමග ඉදිරිපත් කළ යුතු ය.

(6) නැව්ගත කරන්නා විසින් නැව වෙත හෝ එහි නියෝජිතයා වෙත ඍජුවම භාණ්ඩ ගෙනවිත් භාරදෙනු ලබන අවස්ථා-වක, එම නැව්ගත කරන්නා විසින්, මේ නියෝගය යටතේ නියම කරනු ලැබූ ප්‍රකාශය සහ ලේඛන, ක්‍රියාකරු හෝ නෞකාධිපතිවරයා වෙත ගෙනවිත් භාරදෙනු ලැබිය යුතු ය.

(7) භාණ්ඩ මුහුදෙන් ප්‍රවාහන කිරීම සඳහා යැවීමේ දී නැව වෙත හෝ එහි නියෝජිතයා වෙත මේ නියෝගය මගින් නියම කරනු ලැබූ ප්‍රකාශය සහ ලේඛනය ඉදිරි භාරදීම් කටයුතු සිදු කිරීම පිළිබඳව නිසි ලෙස වගබලා ගැනීම නැව්ගත කරන්නා විසින් සිදු කරනු ලැබිය යුතු ය.

(8) නැව්ගත කරන්නා විසින් නැව වෙත හෝ එහි නියෝජිතයා වෙත භාණ්ඩ ගෙනවිත් භාරදෙනු නොලැබ, භාණ්ඩ ඉදිරි භාරදීම් කටයුතු සඳහා හෝ අවසාන වරට භාරදීම සඳහා වෙනත් භාණ්ඩ හෝ නැව් බඩු සමග මෙම භාණ්ඩ ඒකාබද්ධ කිරීම සඳහා වෙනත් තැනැත්තකු වෙත ලබා දෙනු ලබන අවස්ථාවක, මේ නියෝගයේ (6) වන හා (7) වන උප නියෝගවලින් නැව්ගත කරන්නා වෙත වගකීම පැවරෙන බැවින් ලේඛනය සහ ප්‍රකාශය ලබාදීම සඳහා වන වගකීම, භාණ්ඩ යවන්නා මත සහ ඉදිරියේදී භාණ්ඩ පැවරීම සහ ගෙනවිත් භාරදීම සඳහා වගකිවයුතු එක් එක් තැනැත්තා මත රඳා පැවතිය යුතු ය. ප්‍රකාශය සහ ලේඛනය ලබාදීම සඳහා වන වගකීම හුදෙක් භාණ්ඩ නැවට පැටවීමේ හෝ වරාය හෝ පර්යන්තය අවට භාණ්ඩ එහා මෙහා ගෙනයාමේ නිරතවන තැනැත්තන් මත රඳා නොපැවතිය යුතු ය.

(9) මේ නියෝගයේ (8) වන අනු නියෝගයේ නියමයන්, 7 වන සහ 8 වන නියෝගවල ඇතුළත් නැව්ගත කරන්නාගේ කාර්යයන්ට අගතියක් නොවන පරිදි විය යුතු ය.

(10) මේ නියෝගයේ (8) වන අනු නියෝගයේ සඳහන් භාණ්ඩ නැව්ගත කරන්නකු, භාණ්ඩ යවන්නකු හෝ වෙනත් තැනැත්තකු විසින් -

(අ) මේ නියෝග මගින් නියම කරනු ලැබූ ප්‍රකාශය සහ ලේඛනය නැවේ ක්‍රියාකරු හෝ නෞකාධිපතිවරයා වෙත ලබා දීමට අපොහොසත් වන අවස්ථාවක; හෝ

(ආ) ඔහු විසින් අසත්‍ය බව දන්නා ප්‍රකාශයක් සහ ලේඛනයක් ලබා දෙනු ලබන හෝ අපරීක්ෂාකාරී ලෙස යම් විශේෂිත කරුණක අසත්‍ය ප්‍රකාශයක් කරනු ලබන අවස්ථාවක,

ඔහු විසින් වරදක් සිදු කරනු ලැබේ.

(11) නැවේ ක්‍රියාකරුවකු හෝ නෞකාධිපතිවරයා විසින්, ප්‍රකාශයක් සහ ලේඛනයක් නොමැතිව යම් ඇසුරුම්කරන ලද භාණ්ඩ ප්‍රවාහනය කිරීමට භාරගනු ලබන හෝ එම භාණ්ඩ නෞකාස්ථව ගෙන යාමට ගනු ලබන හෝ ලබාගනු ලබන අවස්ථාවක, ඔහු විසින් වරදක් සිදු කරනු ලැබේ.

7. (1) (අ) ඇසුරුම් කරන ලද භාණ්ඩ පිළිබඳ ප්‍රකාශය, ඒවා වර්ගීකරණය, සලකුණු කිරීම, ඇසුරුම් කිරීම, ලේබල් කිරීම, පත්‍රිකා ඇලවීම සහ උචිත පරිදි වරාය අධිකාරිය හෝ බඩු ලබන්නා විසින් නම් කරනු ලැබූ සංවිධානය වෙත කලින් දැනුම්දීම සම්බන්ධයෙන් IMDG සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති සියලුම කොන්දේසිවලට අනුකූල වී ඇත්නම් මිස; සහ

(ආ) ගෙනයා හැකි ටැංකියක හෝ ටැංකි බහාලුමක හෝ වාහනයක භාණ්ඩ තිබෙන අවස්ථාවක,IMDG සංග්‍රහයට අනුව අදාළ ටැංකි පිළිබඳ නියමයන්ට අනුකූලව මුහුදෙන් ප්‍රවාහනය කිරීම සඳහා භාණ්ඩ නිසි ලෙස හා ආරක්ෂිතව සූදානම් කර ඇතිනම් මිස,

නැව්ගත කරන්නා විසින් ඇසුරුම් කරන ලද භාණ්ඩ ප්‍රවාහනය සඳහා ලබා දෙනු නොලැබිය යුතු ය.

(2) යම් භාණ්ඩ නැව්ගත කිරීම සඳහා සූදානම් කිරීමේ දී, මේ නියෝග මගින් නියම කරනු ලබන පරිදි ප්‍රවාහනය කිරීම සඳහා පූර්වාරක්ෂණ සහ සූදානම්වීම් සිදු කරනු ලැබිය හැකි බව සහතික කර ගැනීම සඳහා අන්තරාදායක භාණ්ඩ හෝ සමුද්‍රීය දූෂණකාරක හඳුනාගෙන ඒවා වර්ග කිරීම නැව්ගත කරන්නාගේ කාර්යය විය යුතු ය.

(3) මේ නියෝගයේ (1) වන සහ (2) වන අනු නියෝගවලට අනුකූල වේ නම් මිස, නැව්ගත කරන්නා විසින්, ඉහත 6 වන නියෝගය මගින් නියම කරනු ලැබූ කිසිදු ප්‍රකාශයක් අත්සන් කරනු නොලැබිය යුතු ය.

(4) මේ නියෝගයේ (1) වන අනු නියෝගයේ සිට (3) වන අනු නියෝගය දක්වා වන නියෝගවල විධිවිධාන කඩකරන නැව්ගත කරන්නකු විසින් වරදක් සිදු කරනු ලැබේ.

(5) යම් ඇසුරුම් කරන ලද භාණ්ඩ, (1) වන අනු නියෝගයට අනුකූල නොවන බව සැක කිරීමට නැවේ ක්‍රියාකරුට හෝ නෞකාධිපතිවරයාට සාධාරණ හේතුවක් ඇති අවස්ථාවක, ක්‍රියාකරු හෝ නෞකාධිපතිවරයාට සාධාරණ හේතුවක් ඇති අවස්ථාවක, ක්‍රියාකරු හෝ නෞකාධිපතිවරයා විසින්, ඇසුරුම් කරන ලද භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා භාරගැනීම, නෞකාස්ථව ගෙනයාමට ගැනීම හෝ ලබා ගැනීම නොකළ යුතු ය. මේ ඡේදයේ විධිවිධාන කඩකරන යම් ක්‍රියාකරුවකු හෝ නෞකාධිපතිවරයකු විසින් වරදක් සිදු කරනු ලැබේ.

8. (1) ඇසුරුම් කරන ලද භාණ්ඩ අසුරනු ලබන හෝ නැව්ගත කරනු ලබන හෝ බඩු ප්‍රවාහන ඒකකයකට දමනු ලබන අවස්ථාවක, එහි එම භාණ්ඩ ඇසිරීම සඳහා වගකිවයුතු තැනැත්තා විසින් -

(අ) භාණ්ඩ ගබඩා කිරීම, වෙන් කිරීම සහ ආරක්ෂා කිරීම ප්‍රමාණවත් බව සහ IMDG සංග්‍රහයට අනුකූලව වන බව සහතික කරනු ලැබිය යුතු ය; සහ

(ආ) බඩු ප්‍රවාහන ඒකකය, හඳුනාගැනීමේ අංකය හෝ අංක දක්වමින් සහ මෙහෙයවන ස්ථානය හා දිනය, ඇසිරීම සඳහා වගකිවයුතු තැනැත්තාගේ නම සහ තත්ත්වය සහ සමාගම හඳුනාගනිමින් IMDG සංග්‍රහයේ නියමයන්ට අනුකූලව අත්සන් කරන ලද ඇසුරුම් සහතිකයක් ක්‍රියාකරු හෝ නෞකාධිපතිවරයා හෝ නැව්ගත කරන්නා හෝ භාණ්ඩ යවන්නා වෙත ලබා දෙනු ලැබිය යුතු ය.

(2) ගෙන යා හැකි ටැංකියක්, මාර්ග ටැංකි වාහනයක්, රේල් ටැංකි වැගන් රථයක් හෝ ටැංකි බහාලුමක් තුළ ඇසුරුම් කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් මේ නියෝගය අදාළ නොවිය යුතු ය.

(3) (අ) මේ නියෝගයේ (1) වන අනු නියෝගයේ විධිවිධාන කඩ කරන එම භාණ්ඩ ඇසිරීම සඳහා වගකිව යුතු තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලැබේ.

(ආ) නැවේ ක්‍රියාකරු හෝ නෞකාධිපතිවරයා වෙත අත්සන් කරනු ලැබූ ඇසුරුම් සහතිකය ලබාදීමට අපොහොසත් වන නැව්ගත කරන්නා හෝ භාණ්ඩ යවන්නා විසින් වරදක් සිදු කරනු ලැබේ.

(4) ක්‍රියාකරුවකු හෝ නෞකාධිපතිවරයා විසින්, අත්සන් කරනු ලැබූ ඇසුරුම් සහතිකයක් නොමැති භාණ්ඩ ඇතුළත් යම් බඩු ප්‍රවාහන ඒකකයක් යම් නැවක් වෙත බාරගනු නොලැබිය යුතු ය.

9. 6 වන සහ 8 වන නියෝග මගින් නියම කරනු ලැබූ අන්තරාදායක භාණ්ඩ ප්‍රකාශයක්, සමුද්‍රීය දූෂණකාරක ප්‍රකාශයක්, ඒ හා සමග ඉදිරිපත් කරනු ලබන ලේඛනයක්, ලිපිලේඛනයක් ආකාරයෙන් හෝ ඉලෙක්ට්‍රොනික දත්ත සැකසුමක් හෝ ඉලෙක්ට්‍රොනික දත්ත හුවමාරු ක්‍රමවේදයන් මගින් නෞකාධිපතිවරයා හෝ ක්‍රියාකරු වෙත සෘජුවම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

10. (1) ඇසුරුම් කරන ලද භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන යම් නැවක නෞකාධිපතිවරයකු විසින් -

(අ) නැව්ගත කරන්නා විසින් ඉදිරිපත් කරනු ලැබූ නැව්ගත කිරීමේ ලේඛනවලින් ලබාගත් භාණ්ඩවල නිවැරදි පාරිභාෂික නාමය IMDG සංග්‍රහයට අනුකූලව ඒවායේ වර්ගීකරණය ඒවායේ භාණ්ඩ පිළිබඳ විස්තර දක්වමින්; සහ

(ආ) නැවේ භාණ්ඩ ගබඩා කරනු ලබන ස්ථානය පිළිබඳ විස්තර දක්වමින්,

විශේෂ ලැයිස්තුවක්, නැව් බඩු ලේඛනයක් හෝ ගබඩාකිරීමේ සැලසුමක් නැවේ රැගෙනයාමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන අනුනියෝගය මගින් නියම කරනු ලැබූ තොරතුරු, ඇසුරුම් කරන ලද අන්තරාදායක භාණ්ඩ සහ ඇසුරුම් කරන ලද සමුද්‍රීය දූෂණකාරක යන දෙවර්ගයට ම අදාළ නැව් බඩු ලේඛනයක හෝ ගබඩාකිරීමේ සැලසුමක, ඒකාබද්ධ ලැයිස්තුවක, හෝ එකක් අන්තරාදායක භාණ්ඩවලට අදාළ අනෙක් සමුද්‍රීය දූෂණකාරකවලට අදාළ එවැනි නැව් බඩු ලේඛන හෝ ගබඩාකිරීමේ සැලසුම් ලැයිස්තු, දෙකක ඇතුළත් විය හැකි ය. ඒකාබද්ධ ලේඛනයක් භාවිත කරනු ලබන අවස්ථාවක, කුමන භාණ්ඩ අන්තරාදායක භාණ්ඩ වන්නේ ද කුමන භාණ්ඩ සමුද්‍රීය දූෂණකාරක වන්නේ ද යන වග එහි පැහැදිලිව පෙන්නුම් කළ යුතු ය.

(3) නෞකාධිපතිවරයා විසින්, ඇසුරුම් කරන ලද අන්තරාදායක භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා IMDG සංග්‍රහය මගින් නියම කරනු ලැබූ යම් විශේෂ අතිරේක ලේඛන ද නැවේ රැගෙන යනු ලැබිය යුතු ය.

(4) මේ නියෝගයේ (3) වන උප නියෝගය ප්‍රකාර නැවේ ප්‍රවාහනය කිරීම සඳහා භාණ්ඩ භාරගැනීම සඳහා නියම කරනු ලැබූ එවැනි යම් ලැයිස්තුවක්, නැව් බඩු ලේඛනයක් හෝ ගබඩා කිරීමේ සැලසුමක් සහ යම් විශේෂ අතිරේක ලේඛන, නැවෙන් භාණ්ඩ නිදහස් කරනු ලබන තෙක් පරිශීලනය කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා නැව තුළ තබාගත යුතු ය.

(5) (4) වන ඡේදය මගින් නියම කරනු ලැබූ පරිදි යම් ලැයිස්තුවක්, නැව් බඩු ලේඛනයක් හෝ ගබඩා කිරීමේ සැලසුමක් හෝ විශේෂ අතිරේක ලේඛන නැවේ රැගෙනයාම හෝ තබාගැනීම පැහැර හරිනු ලබන ඇසුරුම්කරන ලද භාණ්ඩ ප්‍රවාහනය කරන නැවක නෞකාධිපතිවරයා විසින් වරදක් සිදු කරනු ලබයි.

11. (1) උචිත පරිදි සහ IMDG සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ඇසුරුම් කරන ලද භාණ්ඩ සලකුණු කර, ලේබල් කර, පත්‍රිකා අලවා ඇත්නම් සහ ධූමකරණ අනතුරු ඇඟවීමේ සංඥාවක් ප්‍රදර්ශනය කර ඇත්නම් මිස එම භාණ්ඩ යම් නැවක ප්‍රවාහනය කිරීම සඳහා එම නැවෙහි රැගෙන නොයා යුතු ය.

(2) ඇසුරුම් කරන ලද භාණ්ඩ සලකුණු කිරීමට, ලේබල් කිරීමට හෝ පත්‍රිකා ඇලවීමට අදාළව මේ නියෝගයේ (1) වන අනු නියෝගයේ විධිවිධාන කඩකරනු ලබන යම් නැව්ගත කරන්නකු විසින් වරදක් සිදු කරනු ලැබේ.

(3) (1) වන ඡේදය මගින් නියම කරනු ලැබූ පරිදි සලකුණු කර, ලේබල් කර හෝ පත්‍රිකා අලවා නොමැති සහ ධූමකරණ අනතුරු ඇඟවීමේ සංඥාවක් ප්‍රදර්ශනය කර නොමැති යම් ඇසුරුමක ඇති අන්තරාදායක භාණ්ඩ හෝ සමුද්‍රීය දූෂණකාරක නැව වෙත භාරගනු ලබන ක්‍රියාකරුවකු හෝ නෞකාධිපතිවරයකු විසින් වරදක් සිදු කරනු ලැබේ.

12. (1) ඇසුරුම් කරන ලද භාණ්ඩ නැවේ ගබඩා කිරීම IMDG සංග්‍රහය මගින් තහනම් කරනු ලබන්නේ නම් ඒවා නැව වෙත බාරගනු නොලැබිය යුතු ය.

(2) IMDG සංග්‍රහයට අනුකූලව යම් අවශ්‍ය අතිරේක ආරක්ෂණ උපකරණ ලබා දෙනු ලබන්නේ නම් මිස ඇසුරුම් කරන ලද භාණ්ඩ නැව වෙත බාරගනු නොලැබිය යුතු ය.

(3) IMDG සංග්‍රහයට අනුකූලව ඇසුරුම් කරන ලද භාණ්ඩ ප්‍රමාණවත් ලෙස ගබඩා කිරීම, වෙන් කිරීම සහ ආරක්ෂා කිරීම කළ යුතු ය.

(4) මේ නියෝගයේ (1) වන හෝ (2) වන අනුනියෝගය කඩකරමින් ඇසුරුම් කරන ලද භාණ්ඩ නැව වෙත භාරගනු ලබන යම් ක්‍රියාකරුවකු හෝ නෞකාධිපතිවරයකු විසින් වරදක් සිදු කරනු ලැබේ.

(5) මේ නියෝගයේ (3) වන අනුනියෝගයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන යම් ක්‍රියාකරුවකු හෝ නෞකාධිපතිවරයකු විසින් වරදක් සිදුකරනු ලැබේ.

13. (1) 14 වන නියෝගය ප්‍රකාර නැව් බඩු ආරක්ෂා කිරීමේ අත්පොතක් යාත්‍රාවේ රැගෙන යනු ලබන අවස්ථාවක, නැව් බඩු ආරක්ෂා කිරීමේ අත්පොතට අනුකූලව යම් මුහුදු ගමනක් මුළුල්ලෙහිම බහාලුම් ඇතුළු නැව් බඩු ප්‍රවාහන ඒකක පැටවීම, ගබඩා කිරීම හා ආරක්ෂා කිරීම කළ යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන අනු නියෝගයට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරිනු ලබන ක්‍රියාකරුවකු හෝ නෞකාධිපතිවරයකු විසින් වරදක් සිදු කරනු ලබයි.

14. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ නැව් බඩු ආරක්ෂා කිරීමේ අත්පොතට අනුකූලව, නැව් බඩු, නැව් බඩු ඒකක සහ නැව් බඩු ප්‍රවාහන ඒකක මුහුදු ගමන මුළුල්ලෙහිදීම පැටවීම, ගබඩා කිරීම සහ ආරක්ෂා කිරීම කළ යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, මේ නියෝගයේ (1) වන උප නියෝගයේ කාර්යය සඳහා සංවිධානය විසින් සම්මත කරනු ලැබූ පිළිගත් සංවිධාන සඳහා වන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව එකී සංවිධානය පිළිගනු ලැබිය යුතු ය.

(3) මේ නියෝගයේ (1) වන අනු නියෝගයේ සඳහන් නැව් බඩු ආරක්ෂා කිරීමේ අත්පොත, සංවිධානය විසින් සකස් කරනු ලැබූ අදාළ මාර්ගෝපදේශයන්ට යටත් පිරිසෙයින් සමාන ප්‍රමිතියකින් පිළියෙල කරනු ලැබිය යුතු අතර එය ඉංග්‍රීසි භාෂාවෙන් තිබිය යුතු ය.

(4) මේ නියෝගයේ (1) වන අනු නියෝගයට අනුකූලවීම පැහැර හරිනු ලබන යම් ක්‍රියාකරුවකු හෝ නෞකාධිපතිවරයකු විසින් වරදක් සිදුකරනු ලබයි.

15. (1) නැවේ ක්‍රියාකරු සහ නෞකාධිපතිවරයා විසින්, නැවේ රැගෙන යනු ලබන ඇසුරුම් කරන ලද භාණ්ඩ සම්බන්ධ හදිසි අවස්ථාවක දී ගනු ලැබිය යුතු අත්‍යවශ්‍ය පියවර පිළිබඳ සියලුම සේවා නියුක්තයන් මනා දැනුවත්භාවයකින් සිටින බව තහවුරු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන අනු නියෝගයට අනුකූලවීම පැහැර හරිනු ලබන යම් ක්‍රියාකරුවකු හෝ නෞකාධිපතිවරයකු විසින් වරදක් සිදුකරනු ලබයි.

## III වන කොටස

### අන්තරාදායක භාණ්ඩ හෝ සමුද්‍රීය දූෂණකාරක තොග වශයෙන් ප්‍රවාහනය කිරීම

16. අන්තරාදායක භාණ්ඩ හෝ සමුද්‍රීය දූෂණකාරක ආරක්ෂිතව පරිහරණය කිරීමට හෝ නැවේ ප්‍රවාහනය කිරීමට නොහැකි බව විශ්වාස කිරීමට නැවේ ක්‍රියාකරුට යම් හේතුවක් ඇත්නම් එකී භාණ්ඩ තොග වශයෙන් පරිහරණය කිරීම හෝ නැවේ ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය.

17. (1) ඝන ස්වභාවයෙන් යුත් අන්තරාදායක භාණ්ඩ තොග වශයෙන් ප්‍රවාහනය කිරීම IMSBC සංග්‍රහයේ අදාළ විධිවිධානවලට අනුකූලව සිදු කළ යුතු ය.

(2) තොග වශයෙන් වන ඝන ස්වභාවයෙන් යුත් අන්තරාදායක භාණ්ඩ, ඒවායෙහි ස්වභාවය අනුව ආරක්ෂිතව සහ සුදුසු ආකාරයට පටවා ගබඩා කළ යුතු ය. එකිනෙක හා නොගැළපෙන භාණ්ඩ එකිනෙකින් වෙන් කළ යුතු ය.

(3) ගින්න ව්‍යාප්තවීමේ හැකියාව අවම කිරීමට ප්‍රමාණවත් පූර්වාරක්ෂණ අනුගමනය කර ඇත්නම් මිස, ස්වයංසිද්ධ තාපනය හෝ දහනයට ඉඩ ඇති තොග වශයෙන් වන ඝන ස්වභාවයෙන් යුත් අන්තරාදායක භාණ්ඩ ප්‍රවාහනය කරනු නොලැබිය යුතු ය.

(4) අන්තරාදායක වාෂ්ප නිකුත් කරන තොග වශයෙන් වන ඝන ස්වභාවයෙන් යුත් අන්තරාදායක භාණ්ඩ, හොඳින් වාතාශ්‍රය ලැබෙන වායු සංස්කරණය කරනු ලබන නැව් බඩු තබන අවකාශයක ගබඩා කරනු ලැබිය යුතු ය.

18. (1) (අ) 1986 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු ඉදිකරනු ලැබූ රසායන ද්‍රව්‍ය නෞකාවක්, ජාත්‍යන්තර තොග රසායන ද්‍රව්‍ය සංග්‍රහයේ නියමයන්ට අනුකූල විය යුතු ය; සහ

(ආ) 1986 ජූලි මස 1 වන දිනට පෙර ඉදිකරනු ලැබූ රසායන ද්‍රව්‍ය නෞකාවක්, අන්තරාදායක රසායන ද්‍රව්‍ය තොග වශයෙන් ප්‍රවාහනය කරන නැව් ඉදිකිරීම සහ සම්පාදනය කිරීම සඳහා වන සංග්‍රහයේ (BCH සංග්‍රහයේ) නියමයන්ට අනුකූල විය යුතු ය; සහ

එම රසායන ද්‍රව්‍ය නෞකාව, අදාළ විය හැකි පරිදි, සම්මුතියේ I වන පරිච්ඡේදයේ 8 වන , 9 වන සහ 10 වන නියෝගවල නියමයන්ට අමතරව එම සංග්‍රහයේ විධිවිධාන සලසා ඇති පරිදි සමීක්ෂණය කොට සහතික කරනු ලැබිය යුතු ය.

(2) (1) වන අනු නියෝගයේ විධිවිධාන ප්‍රකාර නිකුත් කරන ලද සහතිකයක් දරනු ලබන යම් රසායන ද්‍රව්‍ය නෞකාවක්, සම්මුතියේ I වන පරිච්ඡේදයේ 19 වන නියෝගයේ ස්ථාපිත පාලනයට යටත් විය යුතු ය. මේ කාර්යය සඳහා එම සහතිකය, සම්මුතියේ I වන පරිච්ඡේදයේ 12 වන හෝ 13 වන නියෝගය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) රසායන ද්‍රව්‍ය නෞකාව ඉදිකරනු ලැබූ දිනය නොසලකා අලුත්වැඩියා කිරීම්, වෙනස් කිරීම්, නවීකරණයන් සහ ඒ හා සම්බන්ධ සවිකිරීම්වලට භාජනය වන යම් රසායන ද්‍රව්‍ය නෞකාවක්, යටත් පිරිසෙයින් එම නැවට කලින් අදාළ වූ නියමයන්ට අඛණ්ඩව අනුකූල විය යුතු ය. එවැනි නැවක්, 1986 ජූලි මස 1 වන දිනට පෙර ඉදිකරනු ලබන්නේ නම්, එකී අලුත්වැඩියා කිරීම්, වෙනස් කිරීම්, නවීකරණයන් හෝ සවිකිරීම්වලට භාජනය වීමට පෙර එදින හෝ එදිනට පසු ඉදිකරනු ලැබූ නැවක් සඳහා වන නියමයන්ට, යටත් පිරිසෙයින් ඒ හා සමාන ප්‍රමාණයකින්, රීතියක් ලෙස අනුකූල විය යුතු ය. මහා පරිමානයේ අලුත්වැඩියා කිරීම්, වෙනස් කිරීම් සහ නවීකරණයන් සහ ඒ හා සම්බන්ධ සවි කිරීම්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් යුක්ති සහගත සහ ප්‍රායෝගික යැයි සිතන තාක් දුරට 1986 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු ඉදිකරන ලද යම් නැවක් සඳහා වන නියමයන්ට අනුකූල විය යුතු ය.

(4) ඉදිකරනු ලැබූ දිනය නොසලකා, රසායන ද්‍රව්‍ය නෞකාවක් ලෙස පරිවර්තනය කරනු ලැබූ යම් නැවක්. එම පරිවර්තනය කිරීම ආරම්භ කරනු ලබන දින ඉදිකරනු ලැබූ රසායන ද්‍රව්‍ය නෞකාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

19. (1) (අ) 1986 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු ඉදිකරන ලද වායු ප්‍රවාහන නෞකාවක්, ජාත්‍යන්තර වායු ප්‍රවාහනය කිරීමේ සංග්‍රහයේ නියමයන්ට අනුකූල විය යුතු ය; සහ

(ආ) 1986 ජූලි මස 1 වන දිනට පෙර සහ 1976 ඔක්තෝබර් මස 31 වන දිනට පසු ඉදිකරන ලද වායු ප්‍රවාහකයක් ද්‍රවීකරණය කළ වායු තොග වශයෙන් ප්‍රවාහනය කරන නැව් ඉදිකිරීම සහ සම්පාදනය කිරීම සඳහා වන සංග්‍රහයේ (GC සංග්‍රහය) නියමයන්ට අනුකූල විය යුතු අතර,

එම වායු ප්‍රවාහකයා, අදාළ විය හැකි පරිදි, සම්මුතියේ I වන පරිච්ඡේදයේ 8 වන, 9 වන සහ 10 වන නියෝගවල නියමයන්ට අමතරව, එම සංග්‍රහයේ විධිවිධාන සලසා ඇති පරිදි සමීක්ෂණය කොට සහතික කරනු ලැබිය යුතු ය. මේ නියෝගයේ කාර්ය සඳහා, සංග්‍රහයේ නියමයන් අනිවාර්ය නියමයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 1 වන ඡේදයේ විධිවිධාන ප්‍රකාර නිකුත් කරන ලද සහතිකයක් දරනු ලබන යම් වායු ප්‍රවාහකයක්, සම්මුතියේ I වන පරිච්ඡේදයේ 19 වන නියෝගය මගින් ස්ථාපිත කරන ලද පාලනයට යටත් විය යුතු ය. මේ කාර්යය සඳහා, එම සහතිකය, සම්මුතියේ I වන පරිච්ඡේදයේ 12 වන හෝ 13 වන නියෝගය යටතේ නිකුත් කරන ලද සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) වායු ප්‍රවාහකය ඉදිකරනු ලැබූ දිනය නොසලකා අලුත්වැඩියා කිරීම්, වෙනස් කිරීම්, නවීකරණයන් සහ ඒ හා සම්බන්ධ සවිකිරීම්වලට භාජනය වන යම් රසායන ද්‍රව්‍ය නෞකාවක්, යටත් පිරිසෙයින් එම නැවට කලින් අදාළ වූ නියමයන්ට අඛණ්ඩව අනුකූල විය යුතු ය. එවැනි නැවක්, 1986 ජූලි මස 1 වන දිනට පෙර ඉදිකරනු ලබන්නේ නම්, එකී අලුත්වැඩියා කිරීම්, වෙනස් කිරීම්, නවීකරණයන් හෝ සවි කිරීම්වලට භාජනය වීමට පෙර එදින හෝ එදිනට පසු ඉදිකරනු ලැබූ නැවක් සඳහා වන නියමයන්ට, යටත් පිරිසෙයින් ඒ හා සමාන ප්‍රමාණයකින්, රීතියක් ලෙස අනුකූල විය යුතු ය. මහා පරිමාණයේ අලුත්වැඩියා කිරීම්, වෙනස් කිරීම් සහ නවීකරණයන් සහ ඒ හා සම්බන්ධ සවිකිරීම්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් යුක්ති සහගත සහ ප්‍රායෝගික යැයි සිතන තාක් දුරට 1986 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු ඉදිකරනු ලැබූ නැවක් සඳහා වන නියමයන්ට අනුකූල විය යුතු ය.

(4) ඉදිකරනු ලැබූ දිනය නොසලකා, වායු ප්‍රවාහකයක් ලෙස පරිවර්තනය කරනු ලැබූ යම් නැවක්, එම නැව පරිවර්තනය කිරීම ආරම්භ කරනු ලබන දින ඉදිකරනු ලැබූ රසායන ද්‍රව්‍ය නෞකාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

20. (1) තොග වශයෙන් ප්‍රවාහනය කරනු ලබන යම් අන්තරාදායක භාණ්ඩ හෝ සමුද්‍රීය දූෂණකාරක නැව්ගත කරන්නකු විසින්, භාණ්ඩවල ස්වභාවය සහ සෙල්සියස් අංශක 60 හෝ ඊට අඩුවෙන් ජ්වලනාංකය (සංවෘත බඳුන) සහිත ද්‍රව භාණ්ඩ සම්බන්ධයෙන් වන

විට, එම භාණ්ඩවල ජ්වලනාංකය නිශ්චිතව දක්වමින් ද ලිඛිතව දැනුම්දීමක් නැවේ ක්‍රියාකරුට හෝ නෞකාධිපතිවරයාට ලබාදෙනු ලැබිය යුතු ය.

(2) යම් අන්තරාදායක භාණ්ඩ හෝ සමුද්‍රීය දූෂණකාරක තොග වශයෙන් නැව්ගත කරන්නකු විසින් -

(අ) නැවේ ක්‍රියාකරුට හෝ නෞකාධිපතිවරයාට ලිඛිතව දැනුම්දීමක් ලබාදීම පැහැර හරිනු ලබන්නේ නම්; සහ

(ආ) අසත්‍ය බව තමා දන්නා දැනුම්දීමක් ලබා දෙනු ලබන හෝ යම් වැදගත් තොරතුරක් සම්බන්ධයෙන් අසත්‍ය දැනුම්දීමක් නොසැලකිලිමත් ලෙස ලබාදෙනු ලබන්නේ නම්,

ඔහු විසින් වරදක් සිදු කරනු ලබයි.

(3) අන්තරාදායක භාණ්ඩ හෝ සමුද්‍රීය දූෂණකාරක තොග වශයෙන් ප්‍රවාහනය කරනු ලබන නැවක නෞකාධිපතිවරයා විසින් -

(අ) නැව්ගත කරන්නා විසින් ඉදිරිපත් කරන ලද නැව්ගත කිරීමේ ලේඛනවලින් ලබාගත් භාණ්ඩවල නිවැරදි තාක්ෂණික නාමය, ඒවායෙහි ස්කන්ධය හෝ ප්‍රමාණය ඇතුළු දැනට මුහුදු ගමනේ නිරත වන නැවක ප්‍රවාහනය කරනු ලබන අන්තරාදායක භාණ්ඩ හෝ සමුද්‍රීය දූෂණකාරක පිළිබඳ විස්තර, සහ අන්තරාදායක භාණ්ඩ, තොග නැව් බඩු සංග්‍රහයේ ආ ඇමුණුමේ දක්වා ඇති විට, IMDG සංග්‍රහයට අනුකූලව වර්ගීකරණය දක්වමින්; සහ

(ආ) නැවේ භාණ්ඩ ගබඩා කර ඇති ස්ථානය පිළිබඳ විස්තර දක්වමින්,

විශේෂිත ලැයිස්තුවක්, නැව් බඩු ලේඛනයක් හෝ ගබඩා කිරීමේ සැලසුමක්, දැනට මුහුදු ගමනේ නිරත වන නැවක රැගෙන යාමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(4) අන්තරාදායක භාණ්ඩ හෝ සමුද්‍රීය දූෂණකාරක ප්‍රවාහනය කිරීම සඳහා IMSBC සංග්‍රහය, BCH සංග්‍රහය හෝ IBC සංග්‍රහයන් හෝ IGC හෝ වායු ප්‍රවාහනය කිරීමේ සංග්‍රහයන් මගින් නියම කරනු ලබන විට නෞකාධිපතිවරයා විසින් යම් විශේෂ අතිරේක ලේඛන ද නැවේ රැගෙන යා යුතු ය.

(5) නැවේ ප්‍රවාහනය කිරීම සඳහා භාණ්ඩ භාරගැනීම සඳහා අවශ්‍ය කරනු ලබන යම් එවැනි යම් ලැයිස්තුවක්, නැව් බඩු ලේඛනයක් හෝ ගබඩා කිරීමේ සැලසුමක් සහ යම් විශේෂ අතිරේක ලේඛන, නැවෙන් භාණ්ඩ නිදහස් කිරීම කරනු ලබන තෙක් නැව් තුළ දී පරිශීලනය හෝ පරීක්ෂා කිරීම සඳහා නැව තුළ තබා ගත යුතු ය.

## IV වන කොටස

### ඇසුරුම් කරන ලද ප්‍රවිකිරණ න්‍යෂ්ටික ඉන්ධන, ප්ලූටෝනියම් සහ ඉහළ මට්ටමේ විකිරණශීලීතාවක් සහිත අපද්‍රව්‍ය නැව්වල ප්‍රවාහනය කිරීම සඳහා වන විශේෂ නියමයන්

21. (1) INF නැව් බඩු ප්‍රවාහනය කරනු ලබන නැවක්, සම්මුතියේ වෙනත් යම් අදාළ නියමයන්ට අමතරව INF සංග්‍රයේ නියමයන්ට අනුකූල විය යුතු අතර එම සංග්‍රහයේ විධිවිධාන සලසා ඇති පරිදි සමීක්ෂණය කොට සහතික කරනු ලැබිය යුතු ය.

(2) (1) වන අනු නියෝගයේ විධිවිධාන ප්‍රකාර නිකුත් කරන ලද යම් සහතිකයක් දරනු ලබන නැවක්, සම්මුතියේ I වන පරිච්ඡේදයේ 19 වන නියෝගය සහ සම්මුතියේ XI - I වන පරිච්ඡේදයේ 4 වන නියෝගය මගින් ස්ථාපිත පාලනයට යටත් විය යුතු ය. මේ කාර්යය සඳහා එම සහතිකය, සම්මුතියේ I වන පරිච්ඡේදයේ 12 වන හෝ 13 වන නියෝග යටතේ නිකුත් කරන ලද සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## V වන කොටස

### අන්තරාදායක භාණ්ඩ සම්බන්ධ සිද්ධීන් පිළිබඳ වාර්තා කිරීම

22. (1) තොග වශයෙන් ඝන ආකාරයෙන් වන හෝ ඇසුරුම් ආකාරයෙන් වන අන්තරාදායක භාණ්ඩ මුහුදට වැටීමෙන් නැතිවීම සම්බන්ධ හෝ නැතිවීමට ඉඩ ඇති සිද්ධියක් සිදුවන අවස්ථාවක, නෞකාධිපතිවරයා හෝ නැව භාරව කටයුතු කරනු ලබන වෙනත් තැනැත්තකු විසින්, එම සිද්ධිය පිළිබඳ විස්තර ප්‍රමාදයකින් තොරව සහ හැකි උපරිමයෙන් ආසන්නතම වෙරළබඩ රාජ්‍යය

වෙත වාර්තා කරනු ලැබිය යුතු ය. ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ A.851 (20) වන යෝජනා සම්මතයේ විස්තර කරනු ලැබූ පරිදි පොදු මූලධර්ම සහ මාර්ගෝපදේශයන් පදනම් කොටගෙන වාර්තාව පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) (1) වන අනු නියෝගයේ සඳහන් සිද්ධිය ශ්‍රී ලංකා ජල තීරයේ දී සිදු වුවහොත්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත වාර්තාව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන අනු නියෝගයේ සඳහන් නැව අතහැර දමා ඇති අවස්ථාවක, හෝ එවැනි නැවකින් ලද වාර්තාව අසම්පූර්ණ හෝ ලබාගත නොහැකි වන අවස්ථාවක, සම්මුතියේ IX වන පරිච්ඡේදයේ 1.2 වන නියෝගයේ අර්ථ නිරූපණය කර ඇති පරිදි හැකි උපරිමයෙන්, මේ නියෝගය මගින් නෞකාධිපතිවරයා වෙත පවරන ලද වගකීම් සමාගම විසින් පවරාගනු ලැබිය යුතු ය.

## VI වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

23. ශ්‍රී ලංකාවේ පිහිටි යම් වරායක හෝ යම් ස්ථානයක ඇති යම් නැවක්, එවැනි නැවක නැව් බඳේ, උපකරණවල, යන්ත්‍රසූත්‍රවල දෝෂ සහගත තත්ත්වයක්, සේවක පිරිස අඩු බව, අධිකව පැටවීම හෝ නුසුදුසු පැටවීම හේතුවෙන් හෝ සම්මුතිය සමඟ අනුකූල නොවන වෙනත් යම් තත්ත්වයක් හේතුවෙන්, අනාරක්ෂිත නැවක් ලෙස හඳුනා ගනු ලබන අවස්ථාවක දී, එකී නැව සිදුකිරීමට අදහස් කරන සේවයේ ස්වභාවය අනුව, මිනිස් ජීවිතවලට බරපතල හානි සිදු නොකරමින් මුහුදට ගමන් කිරීමට නොහැකි වන යම් අවස්ථාවක, එහි දෝෂ සහගත තත්ත්වය සමීක්ෂණය කිරීමේ හෝ එම දෝෂය නිවැරදි කිරීමේ කාර්යය සඳහා එකී නැව තාවකාලිකව රඳවා තබා ගනු ලැබිය හැකි ය.

24. සම්මුතියේ VII වන පරිච්ඡේදයේ පාදක සටහන් සහ එම පාදක සටහන් මගින් සඳහන් කරනු ලබන යෝජනා සම්මතයන්, චක්‍රලේඛ හෝ ලේඛන, මෙම නියෝගවල කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය.

25. නැව් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මේ නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි, සම්මුතියේ හෝ 1988 ප්‍රොටොකෝලයේ විධිවිධානයන්හි අවම තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාකිරීම සඳහා යම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් නිකුත් කරනු ලැබිය හැකි ය.

26. මේ නියෝගවලට අනුකූල වීම හෝ ඒ අනුව ක්‍රියා කිරීම, සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින හෝ නොසලකා හරින හෝ එහි විධිවිධාන උල්ලංඝනය කරනු ලබන තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර වරදකරු වීමෙන් පසුව රුපියල් මිලියන පහකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

27. මේ නියෝගවල -

"IMDG සංග්‍රහය" යන්නෙන්, සංවිධානය විසින් සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි, MSC.122(75) වන යෝජනා සම්මතය මගින් සංවිධානයේ සමුද්‍රීය ආරක්ෂණ කමිටුව විසින් සම්මත කරනු ලැබූ ජාත්‍යන්තර සමුද්‍රීය අන්තරාදායක භාණ්ඩ (IMDG) සංග්‍රහය අදහස් වේ;

"IMO" යන්නෙන්, යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය අදහස් වේ:

"IMSBC සංග්‍රහය" යන්නෙන්, සංවිධානය විසින් සංශෝධනය කරනු ලැබිය හැකි පරිද, MSC.268 (85) වන යෝජනා සම්මතය මගින් සංවිධානයේ සමුද්‍රීය ආරක්ෂණ කමිටුව විසින් සම්මත කරනු ලැබූ ජාත්‍යන්තර සමුද්‍රීය ඝන ස්වභාවයෙන් යුත් සහ නැව් බඩු තොග (IMSBC) සංග්‍රහය අදහස් වේ;

"ජාත්‍යන්තර තොග රසායන ද්‍රව්‍ය සංග්‍රහය (IBC සංග්‍රහය)" යන්නෙන්, සංවිධානය විසින් සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි, MSC.4 (48) වන යෝජනා සම්මතය මගින් සංවිධානයේ සමුද්‍රීය ආරක්ෂණ කමිටුව විසින් සම්මත කරනු ලැබූ අන්තරාදායක රසායන ද්‍රව්‍ය තොග වශයෙන් ප්‍රවාහනය කරනු ලබන නැව් ඉදිකිරීම සහ සම්පාදනය කිරීම සඳහා වන ජාත්‍යන්තර සංග්‍රහය අදහස් වේ;

"INF නැව් බඩු" යන්නෙන්, IMDG සංග්‍රහයේ 7 වන වර්ගීකරණයට අනුකූලව නැව් බඩු ලෙස ප්‍රවාහනය කරනු ලබන ඇසුරුම් කරන ලද ප්‍රවිකිරණ න්‍යෂ්ටික ඉන්ධන, ප්ලූටෝනියම් සහ ඉහළ මට්ටමේ විකිරණශීලීතාවක් සහිත අපද්‍රව්‍ය අදහස් වේ;

"ජාත්‍යන්තර වායු ප්‍රවාහනය කිරීමේ සංග්‍රහය (IGC සංග්‍රහය)" යන්නෙන්, සංවිධානය විසින් සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි, MSC.5 (48) වන යෝජනා සම්මතය මගින් සංවිධානයේ සමුද්‍රීය ආරක්ෂණ කමිටුව විසින් සම්මත කරනු ලැබූ ද්‍රවීකරණය කළ වායු තොග වශයෙන් ප්‍රවාහනය කරනු ලබන නැව් ඉදිකිරීම සහ සම්පාදනය කිරීම සඳහා වන ජාත්‍යන්තර සංග්‍රහය අදහස් වේ;

"INF සංග්‍රහය" යන්නෙන්, සංවිධානය විසින් සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි, MSC.88 (71) වනයෝජනා සම්මතය මගින් සංවිධානයේ සමුද්‍රීය ආරක්ෂණ කමිටුව විසින් සම්මත කරනු ලැබූ ඇසුරුම් කරන ලද ප්‍රවිකිරණ න්‍යෂ්ටික ඉන්ධන, ප්ලූටෝනියම් සහ ඉහළ මට්ටමේ විකිරණශීලතාවක් සහිත අපද්‍රව්‍ය නැවේ සුරක්ෂිතව ප්‍රවාහනය කිරීම සඳහා වන ජාත්‍යන්තර සංග්‍රහය අදහස් වේ;

"UN අංකය" යන්නෙන්, අන්තරාදායක භාණ්ඩ ප්‍රවාහනය කිරීම පිළිබඳ ආදර්ශ නියෝගයේ සඳහන් පරිදි අන්තරාදායක භාණ්ඩ ප්‍රවාහනය කිරීම සහ ගබඩා කිරීම සඳහා වන එක්සත් ජාතීන්ගේ ක්‍රියාපිළිවෙල යටතේ භාණ්ඩයට හෝ ද්‍රව්‍යයට නියම කර ඇති, ඉලක්කම් හතරකින් යුත් හඳුනා ගැනීමේ අංකය අදහස් වේ;

ECG 01-0248

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.